3149

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

2019.12.02 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා** දී ඇති කව අතුරෙන්, **ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ක්‍රිස්තු උපත වැදගත් සිදුවීමක් ලෙස සැලකෙන්නේ,
(1) බලාපොරොත්තු වූ අන්දමට සිදු වූ නිසා ය.
(2) ජනතාව ඉදිරියේ සිදු වූ නිසා ය.
(3) දිවැස් වැකි සම්පූර්ණ වූ නිසා ය.
(4) බොහෝ කලකට පෙර සිදු වූ නිසා ය.

**2.** දිවැසිවරුන්ගෙන් හා පසුව දේව දූතයන්ගෙන් මරියතුමීට දුන් පණිවුඩය වූයේ ජේසුස් වහන්සේගේ,
(1) ශ්‍රේෂ්ඨත්වය පිළිබඳවයි.
(2) රූප ලක්ෂණ පිළිබඳවයි.
(3) දුගී බව පිළිබඳවයි.
(4) තරාතිරම පිළිබඳවයි.

**3.** දිවැසිවරු පැවසූ ආකාරයට ජේසුස් වහන්සේ සිය මෙහෙවර තුළින් අපට අභියෝග කරන්නේ,
(1) සේවය ලබන අතර අන් අයට සේවය කිරීමට ය.
(2) සේවය ලබන්නට නොව සේවය කිරීමට ය.
(3) සේවයේ නියම අරුත අන් අයට කියාදීමට ය.
(4) සේවය කරන අතර එහි සීමාවන් තේරුම් ගැනීමට ය.

**4.** පේදුරු, තෝමස් සහ මතෙව් යන තිදෙනාටම පොදු ලක්ෂණයක් නම්,
(1) ඔවුන් ධීවරයන් වීමයි.
(2) ජේසුස් වහන්සේ සමග ගෙත්සෙමන උයනේ සිටීමයි.
(3) ජේසුස් වහන්සේ අන්වෙසක් වීමේ දී සිටීමයි.
(4) ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයන් වීමයි.

**5.** පේදුරුගේ මහා ප්‍රකාශය කුමක් ද?
(1) "ඔබ දෙවියන් වහන්සේගේ දිවැසිවරයාණෝ ය."
(2) "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය."
(3) "ඔබ සමග මරණයට යෑමට වුව ද සූදානම් ය."
(4) "ඔබගේ වචන ලොව සීමා දක්වා ගෙන යමි."

**6.** කෙනෙකු තමා ගැන අධිතක්සේරු කරගැනීමේ අවදානම දක්වන උපමාව වන්නේ,
(1) පරිසිවරයා සහ අයකැමියා ය.
(2) ධනපතියා සහ ලාසරස් ය.
(3) යුද්ධයට යන රජකෙනෙකුගේ පෙර සූදානම ය.
(4) පොහොසත් මෝඩයා ගැන ය.

[දෙවැනි පිටුව බලන්න.

7. ස්නාවක ජොහාන්තුමාගේ සේවය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
   A - "සැබැවින්ම යුක්තිය ඉටුකරන්නේ ය."
   B - "මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි."
   C - "එතුමාණෝ ඉසුළුවේ අපේ දුක ය."
   D - "වනාන්තරයේ සමිඳුන් හට මාවතක් සදන්න."
   ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මලාකි හා යෙසායා දිවැසිවරු ස්නාවක ජොහාන් ගැන සඳහන් කරන ප්‍රකාශ මොනවා ද?
   (1) A, B (2) A, C (3) B, C (4) B, D

8. ජුදෙව්වන්ගේ සිත් තුළ තිබූ බලාපොරොත්තුව ඉෂ්ට කරගැනීම සඳහා ජේසුස් වහන්සේ වෙතට යොමු කළ පුද්ගලයා කවුරුන් ද?
   (1) ජොහාන් (2) පේදුරු (3) ස්නාවක ජොහාන් (4) සෙකරියස්

9. ජේසුස් වහන්සේ පිළිබඳ සුභාරංචිය ගෙන ආ දේවදූත පණිවුඩය දැනුම් දුන්නේ,
   (1) සෙකරියස්, මරිය තුමි හා එඬේරුන්ට ය. (2) සෙකරියස්, එලිසබෙත් හා ජෝසප්තුමාට ය.
   (3) සෙකරියස්, ජෝසප්තුමා හා සිමියොන්ට ය. (4) සෙකරියස්, සිමියොන් හා අන්නාට ය.

10. ජේසුස් දරුවා දේව මාලිගයට ගෙන ගිය සිද්ධියෙන් අපට උගත හැකි වැදගත් පාඩම වන්නේ,
   (1) දෙමාපියන් සමග පමණක් දේවස්ථානයට යා යුතු බව ය.
   (2) දෙවියන් වහන්සේට මුල්තැන දීමට දේවස්ථානයට යෑම වැදගත් බව ය.
   (3) වත් පිළිවෙත් තුළින් කිතුනු අනන්‍යතාවය තහවුරු කරගැනීම ය.
   (4) කිතුනුවන් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇතිව ජීවත් වීම ය.

11. පහත ප්‍රකාශ අතුරෙන් ස්නාවක ජොහාන්ගේ සේවය වත්මන් කිතුනුවන්ට වඩාත් වැදගත් යැයි පෙන්නුම් කෙරෙන ප්‍රකාශ මොනවා ද?
   A - අප සතු දේ බෙදාගැනීම වැදගත් බව පිළිගැන්වීම
   B - ජේසුස් වහන්සේට එතුමාගේ සේවය ගැන කියා දීම
   C - යහපත ඉටුකිරීමෙන් සමාජයක් ගොඩනැගීමේ හැකියාව තේරුම් කිරීම
   D - ජනතාව තමා වෙත යොමු කර ගැනීම
   (1) A, B (2) A, C (3) B, C (4) C, D

12. පාසල් ශිෂ්‍යයෙක් ලෙස ඔබට ස්නාවක ජොහාන්තුමාගෙන් ලැබෙන අභියෝගය කුමක් ද?
   (1) මනස්තාපනය (2) කමාවදීම (3) ඉවසීම (4) ප්‍රේමය දැක්වීම

13. හෙරොද් රජු විසින් ස්නාවක ජොහාන්ව ප්‍රතික්ෂේප කරනු ලැබුවේ,
   (1) හෙරොද්ගේ නීති රීති තද වැඩිකම ප්‍රකාශ කළ නිසා ය.
   (2) හෙරොද් අසාධාරණ ලෙස මුදල් පරිහරණය කිරීම හෙළා දැකීම නිසා ය.
   (3) රෝම අධිරාජ්‍යයා සමග හෙරොද් පැවැත් වූ සම්බන්ධතා ගැන විරෝධය පළ කළ නිසා ය.
   (4) හෙරොද්ගේ දූෂ්ටකම ගැන ප්‍රකාශ කළ නිසා ය.

14. ජේසුස් වහන්සේ ඉපදුනු හා හැදුනු වැඩුනු නගර පිළිවෙළින්,
   (1) ජෙරුසලම හා නාසරෙත් ය. (2) ජෙරුසලම හා කානාන් ය.
   (3) බෙත්ලෙහෙම හා කානාන් ය. (4) බෙත්ලෙහෙම හා නාසරෙත් ය.

15. ජේසුස් වහන්සේගේ සිනගෝගයේ ප්‍රථම දේශනයේ තේමා පාඨය කුමක් ද?
   (1) 'ජුදෙව් ජනතාවට දේව රාජ්‍යය සතු ය.'
   (2) 'අන්‍ය ජාතීන්ට ද දේව රාජ්‍යය විවෘත ය.'
   (3) 'තෝරා ගත් අයට දේව රාජ්‍යය අයත් ය.'
   (4) 'දේව රාජ්‍යයට ගෞරවය හිමි වේ ය.'

16. ස්නාවක ජොහාන් හා ජේසුස් වහන්සේ සොයා ආ අයට ඔවුන් හඳුනා ගැනීම සඳහා දුන් සලකුණු වන්නේ,
   (1) පාළුකරයේ හඬ සහ ඔටු ලෝම වස්ත්‍ර ය.
   (2) ගව ඔරුවක බා සිටි බිළිඳා සහ තරුව ය.
   (3) පාළුකරයේ හඬ හා ගව ඔරුවක බා සිටි බිළිඳා ය.
   (4) ගව ඔරුවක බා සිටි බිළිඳා සහ දේවදූත සේනාව ය.

[තුන්වැනි පිටුව බලන්න.

**17.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්නාවක ජොහාන් හා ජේසුස් වහන්සේගෙන් අප ලබන වඩාත් වැදගත් ජීවිත ආදර්ශය කුමක් ද?

(1) විශේෂ දේව සලකුණක් ලැබෙන තෙක් බලා සිටීම
(2) කටුක දිවිපෙවෙතක් ගත කිරීම සඳහා සූදානම්ව සිටීම
(3) දෙවියන් වහන්සේගේ ආලේපය ලැබෙන තෙක් බලා සිටීම
(4) කටුක දිවිපෙවෙතක් ගත කිරීම ගැන මෙනෙහි නොකිරීම

**18.** සිමියොන් සහ අන්නා ජේසුස් වහන්සේ ගැන කළ පොදු ප්‍රකාශය කුමක් ද?

(1) මෙසියස් වහන්සේ ගෙනෙන ලද ගැලවීම.
(2) ඊශ්‍රායල් ජනයාගේ මහිමය.
(3) මෙසියස් වහන්සේ පිළිනොගන්නා අයගේ වැටීම.
(4) ජේසුස් වහන්සේ අනාගතයේ සිදුකරන දිවි පිදීම.

**19.** ජේසුස් වහන්සේ සිනගෝගයේ කරන ලද ප්‍රථම දේශනයේ සංක්ෂිප්ත ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම
B - ධනවතුන්ට ලැබෙන ආශිර්වාද
C - බලවතුන්ට අධිකාරිත්වය
D - පීඩිතවූවන්ට මිදීම

ඉහත දී ඇති ප්‍රකාශ අතුරෙන් දේව රාජ්‍යයේ ලකුණු පමණක් දැක්වෙන ප්‍රකාශ මොනවා ද?

(1) A, B (2) A, C (3) A, D (4) B, C

**20.** 'දියඹට ගොස් දැල් හෙළන්න' යැයි ජේසුස් වහන්සේ පැවසුවේ,

(1) සීමොන්ට ය. (2) ජාකොබ්ට ය. (3) ජොහාන්ට ය. (4) අන්ද්‍රෑට ය.

**21.** ගෝලයන් කැඳවීමේ සිද්ධියෙන් ජේසුස් වහන්සේ අපට ඉදිරිපත් කරන පාඩම වන්නේ,

(1) කැඳවීමට ප්‍රථම අප එය තෝරාගත යුතු බව ය.
(2) සේවය අගය කොට අන් අයට දැන්වීම ය.
(3) ජේසුස් වහන්සේගේ සේවයේ පංගුකාරයන් විය යුතු බව ය.
(4) ජේසුස් වහන්සේගේ සේවයට කවුරුන් හෝ ඉදිරිපත් කළ යුතු බව ය.

**22.** පරිසිවර සීමොන්, මාර්තා හා මරියා සහ සාකෙවුස්ගේ නිවසට ගිය ජේසුස් වහන්සේ ආගන්තුක සත්කාරය ගැන අපට උගන්වන්නේ,

(1) විවිධ අයගේ නිවෙස්වලට යා යුතු බව ය.
(2) තරාතිරම් නොබලා සබඳතාවයන් ඇති කිරීම වැදගත් බව ය.
(3) ආරාධනයක් නොලද වුව ද නිවෙස්වලට යා යුතු බව ය.
(4) නිවසකට පිවිසුන විට චාරිත්‍රානුකූලව ක්‍රියා කළ යුතු බව ය.

**23.** ජේසුස් වහන්සේ ළමුන් හා කාන්තාවන් පිළිගැනීම තුළින්,

(1) ඔවුන්ට වටිනාකමක් ලබා දුන්නේ ය.
(2) අන් අයට වඩා ඉහළින් ඔවුන් ඔසවනු ලැබී ය.
(3) ඔවුන් බලාපොරොත්තු නොවූ අන්දමට ජනප්‍රියත්වයක් ලැබී ය.
(4) ඔවුහු අන් අයට තමා ගැන ප්‍රකාශ කිරීමට යොදා ගත්හ.

**24.** පර්සිවරු හා සද්දුසිවරු ජේසුස් වහන්සේ මුණගැසුණේ කුමක් සඳහා ද?

(1) රහසිගත සාකච්ඡා පැවැත්වීමට
(2) ඔවුන්ගේ ප්‍රශ්නවලට දේව මගපෙන්වීම ලබා ගැනීමට
(3) ජේසුස් වහන්සේට අභියෝග එල්ල කිරීමට
(4) ජේසුස් වහන්සේට සත්‍යය ගැඹුරින් තේරුම් කර දීමට

**25.** කමා නොවූ දාසයා පිළිබඳ උපමාවෙන් ජේසුස් වහන්සේ අපට අභියෝග කරන්නේ,

(1) කමාව දීමට නිතර පෙළඹිය යුතු බවයි.
(2) තමාට නිතර කමාව ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවයි.
(3) කමාව ලැබීමට කමාව දානය කළ යුතු බවයි.
(4) සිය මිතුරන්ට කමාවීමට පසුබට නොවිය යුතු බවයි.

[ශතරවැනි පිටුව බලන්න.

**26.** 'සාමය ඇතිකරන්නෝ භාග්‍ය වන්තයෝ ය.' මේ කියමනට අනුකූලව සමාජයේ සාමය ස්ථාපනය කිරීම සඳහා මනුෂ්‍යයා,
(1) සාමකාමී පුරවැසියකු වීමෙන් සෑහීමට පත්විය යුතු ය.
(2) යුක්තිය හා සාධාරණත්වය ස්ථාපනය කළ යුතු ය.
(3) යුද්ධයෙන් තොර සමාජයක් ගොඩනැගීමට මුල් තැන දිය යුතු ය.
(4) අවශ්‍ය වූ විට බලහත්කාරයෙන් සාමය ගෙන ඒමට ක්‍රියා කළ යුතු ය.

**27.** ජුදෙව් නීතිය ඉහළින් තබා ක්‍රියාකරමින් ඔවුන් ගැන උදම් ඇනූ අයට ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය වූයේ කුමක් ද?
(1) ඔවුන්ව දේව මාලිගයේ දී සුළු කොට සැලකීම
(2) ඔවුන්ව ප්‍රතික්ෂේප කිරීම
(3) ඔවුන්ව නාඳුනන බව පෙන්වීම
(4) දෙවිඳුන් ඉදිරියේ ඔවුන් ප්‍රතික්ෂේප විය හැකි බව පෙන්වීම

**28.** නායක පූජකවරයකු පත් කරනු ලැබුවේ කුමන කණ්ඩායමක් අතුරෙන් ද?
(1) පරිසි කණ්ඩායමෙන් (2) විනයධරයන්ගෙන්
(3) සද්දුසිවරුන්ගෙන් (4) ලෙවිවරුන්ගෙන්

**29.** සබත් නීතියට අනුව ජේසුස් වහන්සේ ඉගැන්වූයේ,
(1) නීතියට අනුකූලව ක්‍රියාකිරීම වැදගත් බව පෙන්වීමට ය.
(2) නීතිය වැදගත් වන්නේ එය දෙවියන් වහන්සේගෙන් නිසා ය.
(3) නීතිය පදනම් වී ඇත්තේ මිනිසාට ඇති ප්‍රේමය සහ දයානුකම්පාව මත ය.
(4) කුමක් සිදු වුව ද නීතිය අනුගමනය කිරීම සියලු දෙනාගේ වගකීමක් බව ය.

**30.** ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.
A - ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් දේව බලය අත්දැකීම
B - දේව රාජ්‍යයේ අවශ්‍යතා ඇති අයට පමණක් දයානුකම්පා වීම
C - යක්ෂයාගේ බලය ක්‍රියාත්මක වන බව ඒත්තු ගැන්වීම
D - ජීවිත කුණාටු ජය ගැනීමට දේව බලය වැදගත් බව ඇන්වීම
ඉහත අදහස් අතුරෙන් දේව රාජ්‍යය පිළිබඳ අදහස් මොනවා ද?
(1) A, B (2) A, C (3) A, D (4) B, D

**31.** අපේක්ෂිත මෙසියස් තුමාගේ විශේෂ ලක්ෂණයක් වූයේ,
(1) නාසරෙත්හී ඇති දැඩි වීම ය. (2) එතුමා ජුදෙවන්ගේ රජ වීම ය.
(3) කුරුසියේ දිවි පිදිය යුතු වීම ය. (4) සාමයේ කුමාරයාණෝ වීම ය.

**32.** බැටළු එඬේරකුගේ චරිත ලක්ෂණ පහත දැක්වේ.
A - බැටළුවන් පෝෂණය කිරීම හා මඟපෙන්වීම
B - සතුරන් පැමිණි විට සිය ජීවිතය රැකගැනීම
C - බැටළුවන්ට ආරක්ෂාව දීම හා තම ජීවිතය ඔවුන් උදෙසා කැප කිරීම
D - බැටළු ලොම්වලින් ප්‍රයෝජන ගැනීම හා රළු දිය පහර මැදින් ගෙනයෑම
ඉහත සඳහන් චරිත ලක්ෂණ අතුරෙන් යහපත් බැටළු එඬේරකු වශයෙන් ජේසුස් වහන්සේ විදහා පෑ ලක්ෂණ මොනවා ද?
(1) A, B (2) A, C (3) B, C (4) B, D

**33.** "මාගේ පාපවලින් මා පිවිතුරු කළ මැනව" යන ප්‍රකාශයේ යැදුම ඉදිරිපත් කළේ කවුරුන් ද?
(1) යෙසායා දිවැසිවරයා (2) ආමොස් දිවැසිවරයා
(3) දාවිත් රජතුමා (4) අපොස්තුළු පාවුල් තුමා

**34.** වත්මන් කිතුනුවන් දිළිඳුභාවය ගැන දැරිය යුතු ආකල්පය නම්,
(1) දිළිඳු බව නිත්‍ය වශයෙන් සමාජයේ පවතින්නක් බව පිළිගැනීමයි.
(2) දිළිඳු බව සතුටින් පිළිගැනීමට දුප්පතුන් දිරිගැන්වීමයි.
(3) දුගී අයට දන්දීමෙන් ඔවුන් සතුටු කිරීමයි.
(4) දිළිඳු තත්ත්වයෙන් ගොඩ ඒමට උදව්වෙමින් ඔවුන් දිරිගැන්වීමයි.

[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**35.** සාමයට සහ සමාජ සේවයට මෑත කාලයේ දී අප රට තුළ කැප වී ක්‍රියා කළ දෙදෙනෙක් නම්,
(1) මයිකල් රොඩ්රිගෝ පියතුමා සහ ජෙරාඩ් ද සිල්වා පියතුමා ය.
(2) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා සහ තිස්ස බාලසූරිය පියතුමා ය.
(3) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා සහ ජෙරාඩ් ද සිල්වා පියතුමා ය.
(4) තිස්ස බාලසූරිය පියතුමා සහ මයිකල් රොඩ්රිගෝ පියතුමා ය.

**36.** එපීසයේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වලින් බැඳී සිටි ජනතාවගේ ක්‍රියාවන් කිහිපයක් පහත දැක්වේ.
A - ඔවුන්ගේ ගුරුකම් ලැයිස්තුවට ජේසුස් වහන්සේගේ නාමය ඇතුල් කිරීම
B - ගුරුකම් ඇතුළත් සියලු පොත්පත් පුළුස්සා දැමීම
C - ගුරුකම් ඇතුළත් පොත් විකුණා පාවුල්ට මුදල් දීම
D - ජේසුස් වහන්සේ පිළිගෙන, ගුරුකම් පසෙකලා, දෙවියන් වහන්සේට සාක්ෂි දැරීම
ඉහත ඒවා අතුරෙන් පාවුල්ගේ ධර්මදූත සේවයෙන් පසු එපීසවැසියන්ගේ ක්‍රියාමාර්ග වූයේ මොනවා ද?
(1) A, B (2) A, D (3) B, C (4) B, D

**37.** නව ජීවිතයකට පිවිසීම සඳහා අභ්‍යන්තර වෙනසක අවශ්‍යතාවය ජේසුස් වහන්සේ දැක්වූ අවස්ථාවක් වන්නේ,
(1) සමාරිත ස්ත්‍රිය සමග කෙරුණ සංවාදයේ දී ය.
(2) නිකදේමුස්ගේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ය.
(3) සීමොන් පරිසිවරයාගේ ක්‍රියා කලාපය හෙළා දුටු අවස්ථාවේ දී ය.
(4) මාර්තාට එම නිවසේ දී අභියෝග කළ අවස්ථාවේ දී ය.

**38.** යෙසායා දිවැසිවරයා විසින් දුක් විඳින සේවකයානන් ලෙස ජේසුස් වහන්සේ හඳුන්වා දීමට හේතු වූ විශේෂ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?
(1) පව් කමා කරන පූජාවේ මරණයකි.
(2) පව්කරුවන් වෙනුවෙන් මැදහත්කාරකම් කරන්නෙකි.
(3) අපේ දුක හා වේදනාව දරන්නෙකි.
(4) කලකිරීමට හා අධෛර්යයට පත්වීමකි.

**39.** කිතුනු මෙහෙවරයේ දී කුරිරු ප්‍රහාරයට මුහුණ දීමට සිදුවුව ද වරදකරුවන්ට සමාව දානය කළේ කවුරුන් ද?
(1) ගරු ජෙරාඩ් ද සිල්වා සහ දෙවන ජුවාම් පාවුල් තුමා
(2) දෙවන ජුවාම් පාවුල් තුමා සහ චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා
(3) ගරු ජෙරාඩ් ද සිල්වා සහ චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා
(4) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා සහ තිස්ස බාලසූරිය පියතුමා

**40.** කිතුනු පවුලක් වශයෙන් සමාජය කෙරෙහි අපේ යුතුකම විය යුත්තේ,
(1) වෙනත් කිතුනු පවුල් සොයාබලා ඔවුනට අනතිත දීම ය.
(2) සියල්ල ඉවසමින්, කමාවෙමින් දේව ගෞරවය සඳහා ක්‍රියා කිරීම ය.
(3) දේව වචනය සමාජය තුළ පතළ කිරීමට යුහුසුළු වීම ය.
(4) සමාජයේ අඩුපාඩු හෙළාදැක නිසි මග කියා දීම ය.

* *

[අනෙක් පිටුව බලන්න.

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

| | |
|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **I, II** |
| கிறிஸ்தவம் | **I, II** |
| Christianity | **I, II** |

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) ජේසුස් වහන්සේ කොටළුවකු පිට රාජ තේජසින් ජෙරුසලමට වැඩම කරන බව දිවැස් වැකි පළ කළ දිවැසිවරයා නම් කරන්න. මෙම ක්‍රියාව මගින් ජේසුස් වහන්සේගේ නායකත්වය පිළිබඳ ඉස්මතු කෙරෙන විශේෂ ගුණාංගය කුමක් ද?

(ii) ධර්මදූත සේවය සඳහා ජේසුස් වහන්සේ පිටත්කර යැවූ ඔහුගේ ගෝලයන් හට දුන් **එක්** උපදේශයක් සහ පවරන ලද **එක්** බලතලයක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේගේ ධර්ම දූත මෙහෙවරයේ ප්‍රධාන තේමාව වූයේ කුමක් ද? එය ඉදිරිපත් කිරීම සඳහා සිය සේවයේ දී උපයෝගි කරගත් **එක්** ක්‍රමවේදයකට උදාහරණයක් සඳහන් කරන්න.

(iv) ඵල නොදැරූ අත්තික්කා ගස යන රූපකයෙන් ජේසුස් වහන්සේ පැවසුවේ කවුරුන් ගැන ද? දේව රාජ්‍යයේ පුරවැසියන් වන අපට එයින් ලබාදෙන පණිවුඩය කුමක් ද?

(v) පහත දැක්වෙන ජුදෙව් චාරිත්‍ර දෙකෙහි ඓතිහාසික වැදගත්කම කුමක් ද?

(අ) චර්ම ඡේදනය

(ආ) කුලුඳුල් පිරිමි දරුවන් කැප කිරීම

(vi) (අ) ජෙරුසලමේ මන්ත්‍රණ සභාවේ නායකත්වය දැරුවේ කවුරුන් ද?

(ආ) ජෙරුසලමේ මන්ත්‍රණ සභාව මගින් අන්‍ය ජාතීන් ලැබූ වරම කුමක් ද?

(vii) ආමෝස් දිවැසිවරයා ප්‍රකාශ කළ එදා සමාජයේ පැවැති අයුක්තිය හා අසාධාරණය අද අප සමාජයේ දක්නට ලැබෙන්නේ කුමන අන්දමට ද?

(viii) 1 කොරින්ති 13 වන පරිච්ඡේදයේ සඳහන් වන 'ප්‍රේම පාරමිතාවේ' 'ප්‍රේමය' තුළින් ඉස්මතු වන අප ජීවිතවලට අනුගත කළ යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(ix) පාවුල් තුමා සමග පළමු ධර්මදූත චාරිකාවේ සම්බන්ධ වූ **එක්** අයෙක් නම් කර, මෙම චාරිකාවේ දී පාවුල් සිදු කළ ප්‍රධාන හාස්කමක් සඳහන් කරන්න.

(x) දේව රාජ්‍යයේ **එක්** ප්‍රධාන ප්‍රතිපත්තියක් සඳහන් කර, එය සනාථ කිරීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමාව කුමක් දැයි ලියන්න.

**2.** 'මනුෂ්‍ය පුත්‍රයාණෝ සබත් දිනට පවා අධිපතියාණෝ ය'

(i) ජේසුස් වහන්සේ ඉහත ප්‍රකාශය කිරීමට තුඩුදුන් පසුබිම කුමක් ද?

(ii) ජේසුස් වහන්සේ නීතිය හා චාරිත්‍රවලට වඩා මනුෂ්‍යත්වය උතුම් බව දැක්වීමට උපයෝගි කරගත් අවස්ථා **තුනක්** සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න.

(iii) ජේසුස් වහන්සේ ක්‍රියාකළ ආකාරය ආදර්ශයට ගනිමින් කිතුනු අප සමාජ සාධාරණත්වය හා යහපත උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** පහදන්න.

**3.** (i) දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් ජේසුස් වහන්සේ අපේක්ෂා කරන විශේෂ චරිත ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) ඉහත (i) හි සඳහන් කරන ලද **එක්** චරිත ලක්ෂණයක් ගෙනහැර පෑමට ජේසුස් වහන්සේ උපයෝගි කර ගත් **එක්** උපමාවක් ලුහුඬින් ඉදිරිපත් කරන්න.

(iii) ජේසුස් වහන්සේගේ උපමා තුළින් ඉදිරිපත් කරන ලද දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ තිබිය යුතු චරිත ලක්ෂණ **පහක්** පැහැදිලි කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

| විෂයය අංකය / பாட இலக்கம் | 15 | විෂයය / பாடம் | ක්‍රිස්තියානි ධර්මය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 3 | 31. | 4 |
| 02. | 1 | 12. | 1 | 22. | 2 | 32. | 2 |
| 03. | 2 | 13. | 4 | 23. | 1 | 33. | 3 |
| 04. | 4 | 14. | 4 | 24. | 3 | 34. | 4 |
| 05. | 2 | 15. | 2 | 25. | 3 | 35. | 2 |
| 06. | 1 | 16. | 3 | 26. | 2 | 36. | 4 |
| 07. | 4 | 17. | 2 | 27. | 4 | 37. | 2 |
| 08. | 4 | 18. | 1 | 28. | 3 | 38. | 4 |
| 09. | 1 | 19. | 3 | 29. | 3 | 39. | 1 |
| 10. | 2,3 | 20. | 1 | 30. | 3 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | |
|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25 / 40 |
| I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள் | 25 / 40 |



+94 71 800 8533 / +94 77 088 2228  WWW.PADANAMAPUBLICATION.LK

## II වන ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

නිපුණතා සහ දැනුම වර්ධනය කිරීම මෙම ප්‍රශ්න පත්‍රය තුළින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ල පදනම් වී ඇත්තේ 10,11 වසර පෙළ පොත් දෙක හා ශුද්ධ බයිබලය ඇසුරෙන්ය. I වන ප්‍රශ්නය අනිවාර්ය වේ. පිළිතුරු නිශ්චිත විය යුතුය. සෙසු ව්‍යුහගත ප්‍රශ්නවල 3 වන කොටස සිසුන්ගේ ආකල්ප හා නිපුණතා වර්ධනයට යොමු කෙරේ. එහෙයින් එම කොටසට වැඩි ලකුණු පිරිනැමේ. පිළිතුරු පත්‍රයෙහි සඳහන් නොවූවත් එම කොටසට/ ප්‍රශ්නයට අදාළ සිසු අත්දැකීම් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ප්‍රදානය කළ හැකිය.

### ලකුණු දීමේ උපදෙස්

I වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10ක් ඇතුළත්ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ.

10 x 2 = 20

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ -

| | ලකුණු |
|---|---|
| (i) වන කොටසට | 02 |
| (ii) වන කොටසට | 03 |
| (iii) වන කොටසට | 05 |
| මුළු ලකුණු සංඛ්‍යාව | 10 |

තෝරාගත් ප්‍රශ්න 4 ට 10 x 4 = 40

07 වන ප්‍රශ්නයේ කොටස් 2 ට ලකුණු 05 බැගින් (2 x 05 = 10)

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

v. චර්ම ඡේදනය - ඉශ්රායල් ජනතාව හා දෙවියන් වහන්සේ සමග ආබ්‍රහම්ගේ ගිවිසුම

කුළුදුල් පිරිමි ළමුන් කැප කිරීම - මිසර දේශයේ වහල් භාවයෙන් නිදහස් වීම

vi. නායකත්වය දැරූවේ - ජාකොබ්

අන්‍ය ජාතීන්ගේ ලැබූ වරම - චර්ම ඡේදන චාරිත්‍රය නොමැතිව සහභාගි වීම

vii. එදා ආමොස් පැවසූ, අද සමාජයේ දුප්පතුන්ට ඇති පීඩා ශ්‍රම සූරා කෑම

හොර තරාදි භාවිතය, දුප්පතුන් නොසලකා හැරීම

ධනවත් අයගේ සුඛෝපභෝගී ජීවිත සඳහා බදු අය කිරීම

තරාතිරම් අනුව බෙදීම

viii. ඉවසිලිවන්ත, කරුණාවන්තය, ඊර්ෂ්‍යා නැත, ආර්ථකාමීත්වය නොවේ.

............................... යනාදි ලෙස දක්වා ඇති ප්‍රේමයේ ගුණාංග 2 ක් නිහතමානි

ix. බර්ණබස්, ජොහාන් මාර්ක්

ලුස්ත්‍රවේ කොරෙකු සුව කිරීම, පාපස්හී බාර් ජේසුස් නැමති ඉන්ද්‍රජාලියාගේ බලය මර්ධනය කිරීම.

x. ආරාධනයක් දීම - උපමාව මහා මංගල භෝජනය

නැති වුවන් සොයා යාම - නැතිවූ බැටලුවා, නැතිවූ කාසිය, නැතිවූ පුත්‍රයා

(ඉහත සඳහන් ප්‍රතිපත්ති 2න් එකක් සහ එයට අදාල උපමාව තිබිය යුතුය)

**(ලකුණු 20)**

**2.** 'මනුෂ්‍ය පුත්‍රයාණෝ සබත් දිනට පවා අධිපතියාණෝ ය'

(i) ජේසුස් වහන්සේ ඉහත ප්‍රකාශය කිරීමට තුඩුදුන් පසුබිම කුමක් ද?

(ii) ජේසුස් වහන්සේ නීතිය හා චාරිත්‍රවලට වඩා මනුෂ්‍යත්වය උතුම් බව දැක්වීමට උපයෝගී කරගත් අවස්ථා **තුනක්** සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න.

(iii) ජේසුස් වහන්සේ ක්‍රියාකළ ආකාරය ආදර්ශයට ගනිමින් කිතුනු අප සමාජ සාධාරණත්වය හා යහපත උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** පහදන්න.

(i) ගෝලයන් සබත් දිනයේදී කරල් කඩා කෑම නිසා පරිසිවරු චෝදනා කළ අවස්ථාව.

**(ලකුණු 02)**



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii) සබත් දිනයේ අත වාරු නැති මිනිසා සහ කුදු ස්ත්‍රිය සුව කිරීම.

ලාදුරු රෝගීන්ට අත ගසා සුව කිරීම.

අංශ භාගී රෝගියාට පව් සමාව දානය කිරීම.

පව්කාර ස්ත්‍රියට ගල් ගසා මැරීමට ඉදිරිපත් කළ අවස්ථාව

**(ලකුණු 03)**

(iii)
- ඉරු දින වුවද යම් අවශ්‍යතාවයක් හෝ කරදරයක් ඇති කෙනෙකුට පිහිට වීම
- රෝගී අය උදෙසා යාච්ඤාවේ යෙදීම.

උදා:- ලාදුරු රෝගීන් සුවය - ඒඩ්ස්, කුෂ්ඨ රෝග ඇති අයට පිළිගැනීමක් දීම.

- ආරෝග්‍ය ශාලා වල රෝගීන්ට උපස්ථාන කිරීම.
- යම් කිසි කොනෙකු වරදට බැදී සිටී නම් යහ මගට ගෙන ඒමට ක්‍රියා කිරීම.
- මත් ද්‍රව්‍ය වැනි දේට ඇබ්බැහිවී සිටින කෙනෙකු හෝ මිතුරෙකු පුනුරුත්තාපනයට යොමු කිරීම.
- මත්ද්‍රව්‍ය, නවීන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මඟින් නොමග - ගිය මිත්‍රයෙක් යහ මඟට ගැනීමට උත්සහ කිරීම.

සබත් දින යහපත් ක්‍රියා - ඉරු දින දේවස්ථානයේදී හෝ නිවස අවට පීඩිතයෙකුට සරණ වීම, උදව් කිරීමේදී තරාතිරම නොබලා උදව් කිරීම.

**(ලකුණු 05)**

**3.** (i) දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් ජේසුස් වහන්සේ අපේක්ෂා කරන විශේෂ චරිත ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) ඉහත (i) හි සඳහන් කරන ලද **එක්** චරිත ලක්ෂණයක් ගෙනහැර පෑමට ජේසුස් වහන්සේ උපයෝගි කර ගත් **එක්** උපමාවක් ලුහුඬින් ඉදිරිපත් කරන්න.

(iii) ජේසුස් වහන්සේගේ උපමා තුළින් ඉදිරිපත් කරන ලද දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ තිබිය යුතු චරිත ලක්ෂණ **පහක්** පැහැදිලි කරන්න.

(i) චරිත ලක්ෂණ - සේවක නායකත්වය, අන් අය වෙනුවෙන් වැය වීම.

ස්ථානොචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීම.

තලෙන්ත උපරිම ලෙස කැප කිරීම.

(ඉහත සඳහන් චරිත ලක්ෂණ 2ක් ලියා තිබිය යුතුය.)

**(ලකුණු 02)**



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii) අන් අය වෙනුවෙන් කැප වීම - උපමාව යහපත් සාමාජිකයා

ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම - වංචනික ගබඩාකාරයා

තලෙන්ත උපරිම ලෙස කැප කිරීම - රන් කාසි 10 පිළිබඳ උපමාව.

(මින් එක් උපමාවක් ලුහුඬින් ලියා තිබීම අපේක්ෂිතය)

සේවක නායකත්වය - ගෝලයන්ගේ පාද සේදීම.

(ලකුණු 03)

(iii) • අද සමාජයේ තරාතිරම් වැනි භේද මත ක්‍රියා කරේ - යහපත් සාමාජිකයා සිය කාලය, මුදල්, පහසුකම් පසෙකලා උදව් විය. එමෙන්ම ජාති භේද නොතකා ක්‍රියා

• කිරීම වැදගත් වේ.සමාජය තුල නිතර ප්‍රඥාවෙන් තොර ක්‍රියාකාරකම් නිසා

• ආර්ථික, සමාජීය හා දේශපාලනික ලෙස ප්‍රපාතයකට වැටීම වැලැක්වීමට කිතුනුවන් ක්‍රියා කළ යුතුය.

• කිතුනු අය සංගීතය, ක්‍රීඩාව, කළමණාකරනය ආදී තලෙන්ත භාවිතා කළ යුත්තේ ආත්මාර්ථකාමීත්වයෙන් තොරව මුළු මහත් සමාජ යහපත උදෙසාය. එහෙත් අද දක්නට ලැබෙන්නේ තම තම මුදුන් පමුණුවා ගැනීමයි.

• ඒ වෙනුවට බහුවිධ සමාජයේ සියලු දෙනා සමඟ සහයෝගයෙන් සිටීම.

(සිසුන් ලියා ඇති උපමා සහ ඊට අදාල චරිත ලක්ෂණ පිළිබඳ ව ලකුණු ප්‍රධානය කරන්න)

(ලකුණු 05)

4. දරුවන් දේව දායාදයක් ලෙස බයිබලය අපට අනාවරණය කරයි.

(i) ජේසුස් වහන්සේ මෙලොව සේවය කළ කාලය තුළ දී ජුදා සමාජයේ දරුවන්ට හිමි වූයේ කෙබඳු තත්ත්වයක් ද?

(ii) ජේසුස් වහන්සේ දරුවන්ගේ වටිනාකම සිය අනුගාමිකයන්ට විදහා පෑ අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) වත්මන් සමාජය තුළ ඇති ළමා අපචාර **පහක්** ලැයිස්තු ගත කර, එබඳු තත්ත්ව වලක්වාලීමට හා ගොදුරු වූවන්ට අතහිත දීමට කිතුනු අප ගත යුතු ක්‍රියාමාර්ග **පහක්** යෝජනා කරන්න.

(i) ජේසුස් වහන්සේ විසු ජුදා සමාජයේ එවකට දරුවන්ට නිසි පිළිගැනීමක් නොතිබුණි. වයස අවු 12 දී පමණක් පිරිමි දරුවන්ට ව්‍යවස්ථාව ඉගෙන ගැනීමේ අවස්ථාව තිබුණි.ප්‍රශ්න ඇසීම, කථා කිරීමේ අයිතිවාසිකම හිමි නොවීය. පිරිමි දරුවාට පවුලේ පිළිගැනීම තිබුණි.

(ලකුණු 02)



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii) ජෙරුසලම් මව්වරුන් දරුවන් ජේසුස් වහන්සේ වෙත රැගෙන ආ අවස්ථාවේ ඔවුන්ට ආශිර්වාද කිරීම. ගෝලයන් ජේසුස් වහන්සේගෙන් දේවරාජ්‍යයේ ශ්‍රේෂ්ඨ තැනැත්තා කවරෙක්දැයි ප්‍රශ්න කළ විට කුඩා දරුවකු ගෙන පෙන්වා එලෙස යටහත් වීමෙන් බව ප්‍රකාශ කිරීම. දරුවන් නොමඟ යවන අය ගැන ප්‍රකාශ කළේ - එබඳු පුද්ගලයන් ගලක් බැඳ දියෙහි ගිල්වීම සුදුසු බව.

**(ලකුණු 03)**

(iii) සමාජයේ අද දක්නට ඇති ළමා අපචාර :-

ගෘහ සේවයට යොදා ගැනීම.

ලිංගික දූෂණවලට ගොදුරු වීම.

මත්ද්‍රව්‍ය ජාවාරම සහ සොරකම් කිරීමට යොදා ගැනීම.

ගල් කොරිවල වැඩට යෙදීම.

විදේශ වල රැකියා වලට යොමුවු දෙමාපියන් නිසා.

දරුවන් බලා ගන්නා අයගේ තාඩන පීඩන වලට ගොදුරු වීම.

ගත හැකි ක්‍රියා මාර්ග - වැඩිහිටියන් හෝ කිතුනු සංවිධාන මඟින්,

- ❖ බලධාරීන්ට දැන්වීම.
- ❖ දෙමාපියන්ට හා දරුවාට අවබෝධ ලබා දීමේ වැඩපිළිවෙල දියත් කිරීම.
- ❖ මාධ්‍යය මඟින් ඒවැනි අපචාර ප්‍රසිද්ධියට පත් කිරීම.
- ❖ එබඳු අය පිළිබඳ බලධාරීන් දැනුවත් කිරීම මඟින් නීතියේ රැහැන මත ගැන්වීම.
- ❖ එබඳු අපචාර වලට ලක්වුවන් වෙනුවන් හඬක් නැගීම.
- ❖ කොන්වු දරුවන් ඇසුරට ගැනීම හා පාසලේදි ඔවුන් පිළිගැනීමට යොමුවීම.

**(ලකුණු 05)**



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iii). නමස්කාර ජීවිතය ආදර්ශයට ගනිමින් :- දිනපතා උදෑසන සහ සවස යාච්ඤා හා බයිබල් අධ්‍යන කටයුතු වල යෙදීම, දේවස්ථාන පිරිස සමඟ දේව ප්‍රශංසාවට යොමු වෙමින් රොටී කැඩීමේ සමූහ නමස්කාර වත් පිළිවෙත් අනුගමනය කිරීම.

ධර්මදාන මෙහෙවර අනුව :- ශුභාරංචි ප්‍රකාශ කිරීමේ වැඩපිළිවෙල දියත් කිරීම,
කිතුනු දරුවකු ලෙස ආදර්ශමත්ව ජිවත් වීම.
රෝගාතුර අය උදෙසා යාච්ඤා පැවැත්වීම
දහම් පාසැල් පවත්වාගෙන යෑම.
ආරෝග්‍යශාලාවල දයාවේ සේවයන්ට යොමු වීම
ලකුණු මඟින් විශ්වාසය හා ඇදැහිල්ල සභාව තුළ වර්ධනය කිරීමට වැඩ පිළිවෙළ යොදා ගැනීම.

ශුභ සාධක කටයුතු ව්‍යාප්ත කිරීම - සභාව හෝ දේවස්ථානය අවට ඇති අවශ්‍යතා සලකා බලා ඒ සඳහා සංවිධානය වී ස්වේච්ඡාවෙන් සේවය කිරීම, ජාති ආගම් භේදයෙන් තොරව පැල්පත් වාසින්ගේ අවශ්‍යතා සපුරාලීමට අතහිත දීම. සභා සතු වත්කම් හැකි පමණ බෙදා ගනිමින් අන් අය උදෙසා ක්‍රියාකිරීම.

(ලකුණු 05)

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් තෝරා ගෙන, බයිබලීය ඉගැන්වීම් පදනම් කරගෙන ලුහුඬු සටහන් ලියන්න.
(i) කිතුනු එක්සත්කම
(ii) අභියෝග මැද සේවය
(iii) දුක් විඳීම පිළිබඳ කිතුනු ආකල්පය
(iv) සේවක නායකත්වය

ලුහුඬු සටහන් ලිවීම - බයිබලීය ඉගැන්වීම් පදනම් සතුයි.

(i). කිතුනු එක්සත් කම - විවිධත්වය තුල ඒකත්වය ජේසුස් වහන්සේ හිස වන අතර අපි විවිධ අවයවයන් ලෙස බැදී සිටිමු- ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාවෙන් පිතෘමා දෙවියන් වහන්සේ සමඟ එක්සත් වන්නා සේ සියලු ඇදහිලිවන්තයන් සම්බන්ධවීමේ අවශ්‍යතාවය එක්සත්කමේ සංකේතය ලෙස - බෞතීස්ම පිළිගැනීම. කිතුනු එක්සත් කම උදෙසා පිහිටුවා ඇති සංවිධාන ජා.ක්‍රි.ම, ලෝක කිතුනු සංවිධාන, තරුණ ක්‍රිස්තියානි සංවිධානය ආදිය.

(ලකුණු 05)



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii). අභියෝග මැද සේවය - පුරාණයේ දිවැසිවරු අභියෝග මැද සේවයේ උදාහරණ, ජේසුස් වහන්සේ සිය මෙහෙය ආරම්භයේ සිට මුහුණ දුන් අභියෝග පරීක්ෂාවන් ජය ගැනීම, පරිසි සද්දුසි වරුන් ගෙන් පැමිණි අභියෝග මැද ක්‍රියා කිරීම, කුරුසියේ පූජාව, පාවුල්ගේ ධර්ම දූත සේවයේ ඔහු මුහුණ දුන් අභියෝග දේව බලයෙන් ජය ගැනීම. මෑත කාලයේ අභියෝග වලට මුහුණ දුන් අය ගැන - පොතෙහි දී ඇති චරිත

**(ලකුණු 05)**

(iii). දුක් විඳීම පිළිබඳ කිතුණු ආකල්පය - බයිබලයේ මුල් ඉගැන්වීමේ තුළ සිටම දුක්විඳීම හා එය දේව බලයෙන් ජය ගැනීම පෙන්වා දී ඇත. පැරණි දිවැසිවරු දේව වචනය ප්‍රකාශ කිරීමේ දී දුක් විඳීම දරා ගනු ලැබීය. යෙසයා දිවැසිවරාය දුක්විඳීමේ සේවකයාණෝ ලෙස ජේසුස් වහන්සේව ඉදිරිපත් කර ඇත. දේව රාජ්‍යය වෙනුවෙන් දුක්විඳීම අවශ්‍ය බව චිත්තු ගැන්වේ. එහෙත් දුක් විඳීමෙන් පලා යෑමක් නොව ඒ හරහා ගොස් බලා පෙරොත්තුවේ ජයග්‍රහණයට ලගාවෙයි. දුක් විඳීම තුළින් කුරුසියේ දිවි පිදු ජේසුස් වහන්සේ ලබා දෙන ජයග්‍රහණයකි. දුක් විඳීම ප්‍රීතියෙන් බාර ගැනීමේ සංකල්පය ඉදිරිපත් කෙරේ.

**(ලකුණු 05)**

(iv). සේවක නායකත්වය - එඬේර රූපකය ජේසුස් වහන්සේ යහපත් එඬේරා ලෙස බැටළුවනට දෙන නායකත්වය තම ජීවිතය පවා පිදීම ජේසුස් වහන්සේගේ නායකත්වයට ගෙන දුන් අර්ථය - නිහතමානී බව ගොලයන්ගේ පාද සේදීම - කොන්වූවන් පිළිගැනීම, පව්කරුවනට මිතුරෙකු වීම, රජෙකු වුවද කොටළුවෙකු පිට ජෙරුසලමට පිවිසීම ප්‍රචන්ඩත්වය තමා පිට ගැනීමතුළින් ක්‍රියා කිරිම, අන් අයව දරා ගැනීම, බලයෙන් ඔවුන් පීඩාවට පත් නොකිරීම. සේවකයන් ලෙස අනුගාමිකයන්ගේ බර ඉසිලීම.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

**සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.**